# ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ
# අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන
# බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: ආහාර කොමසාරිස්
යොමු අංකය: පා1-2/බ.ගැ.ප./වැ.පරි. දිනය: 2011.12.26

1.2 අමාත්‍යාංශය : සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ
යොමු අංකය: CIT/2/9/2/26 දිනය: 2012.01.11

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය: DMS/C/08/45/02 දිනය: 2011.11.03

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය: EST-3/RECRU/03/13003 දිනය: 2012.01.23

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය: NSCC/1/45/007/SR දිනය: 2012.01.19

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය: PSC/EST/7/1/45/1/2012 දිනය: 2014.05.09

## 02. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ආහාර කොමසාරිස්

## 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික)

3.2 ශ්‍රේණි : I , II , III

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය:

ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතුවූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන් එනම් තෘතික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තිය කුසලතා (N.V.Q) මට්ටම හය (06) යටතට ගැනෙන්නාවූ පාඨමාලා කාල සිමාව මාස 13 සහ 24 අතර වූ අදාල කාල සීමාවකට අයත් වන්නාවූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම සේවා ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂි කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටුකළ යුතුය.

3.4 ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයන් සේවයේ අවශ්‍යතාව මත යෝජ්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN - 03 – 2006-A

5.2 වැටුප් පරිමාණය : රු. 15,005 – 4X180 -6X240 –11X320 –20 X 360 – 27,885

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | පියවර 01 | රු. 15,005/- |
| II | පියවර 12 | රු. 17,485/- |
| I | පියවර 23 | රු. 21,045/- |

**06. සේවා ගණයට අයත් තනතුරු/ තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| වැඩ පරීක්ෂක | III | 01 | 1. නව ගබඩා ඉදිකිරීම් හා පවතින ගබඩා අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන ඇස්තමේන්තු සකස් කිරීම.<br>2. කාර්යාලීය ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කිරීම.<br>3. සකස් කරන ලද ඇස්තමේන්තු මත ඉදිකිරීම් කටයුතු නිවැරදිව සිදුවන්නේද යන්න පරීක්ෂා කර දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත වාර්තා කිරීම.<br>4. අවසන් ගෙවීම් පිළිබඳ නිර්දේශ ලබාදීම.<br>5. දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳව පසු විපරම් කටයුතු ඉටු කිරීම<br>6. ගබඩා නිවාස හා කාර්යාලීය ගොඩනැගිලි කුලියට ලබා දීමේදී, පැවරීමේ හා ආපසු ලබා ගැනීමේ කටයුතු ඉටු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | | 7.වරිපනම් ගෙවීම පිළිබඳ සොයා බලා අදාල කටයුතු ඉටු කිරීම.<br><br>8.ජල හා විදුලි සම්බන්ධතා බිඳ වැටීමේදී අදාල ආයතන සමග කටයුතු කිරීම.<br><br>9.තනතුරට අදාලව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව 01

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III,II හා I සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාල නොවේ |

සටහන : -

I. 111,11,1 යන ශ්‍රේණියන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරග විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය තුල නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව 03 ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්:

7.1.2.1 අධ්‍යාපන සුදුසුකම් :

(1) භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර සමත් වී තිබීම.

6/24

සහ

(11) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

1) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

11) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

111) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

1V) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

V1) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

V11) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ

නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :අවුරුදු 18 යි

7.2.3.2 උපරිම සීමාව :අවුරුදු 30

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත විභාගයකින් බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

7.2.4.1.1 පවත්වන බලධරයා : ආහාර කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

අදාළ විෂය නිර්දේශය ඇමුණුම 01 හි දැක්වේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :ආහාර කොමසාරිස්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාල නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාල නොවේ.

**08. කාර්යක්ෂමතා කඩඉම්**

8.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය

**09. රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය

**10. ශ්‍රේණි උසස් කිරීම**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

සටහන:- පළමුවන හා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා වන විෂය නිර්දේශයන් ඇමුණුම 02 හා ඇමුණුම් 03 මගින් දක්වා ඇත.

11. තනතුරුවලට පත් කිරීම : අදාල නොවේ

8/24

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාල නැත

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

"සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. සේවයේ යෙදී සිටි නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යපරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාලවේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ (අත්සන) ..........................

(විෂයභාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )

නම : එම්.ඒ.ඒ.කුසුමාංගනී

තනතුර : පරිපාලන නිලධාරී (වැ.බ)

දිනය :2014.05.21

පරීක්ෂා කළේ (අත්සන) ..........................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )

නම : අශානි එන්.පියසුමන

තනතුර : සහකාර ආහාර කොමසාරිස්

දිනය : 2014.05. 21

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : එන්.නිමල්කා ඩයස්

නිලමුද්‍රාව

දිනය: 2014.05. 22

යොමු අංකය : CIT/2/9/2/26

කොමසාරිස් දෙපාර්තමේන්තුවේ වැඩ පරීක්ෂක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය රීම නිර්දේශ කරමි.

අත්සන : ..................................

නම : පී.කේ.ඩී.අමරවර්ධන

තනතුර : ලේකම්

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

දිනය: 2014.05.30

නිලමුද්‍රාව: පී. කේ. ඩී. අමරවර්ධන
ලේකම්,
සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය
සතොස මහ ලේකම් කාර්යාලය,
නො. 27, වොක්ෂොල් වීදිය,
කොළඹ 02.

---

යොමු අංකය : PSC/ESI/7/1/45/1/2012

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව හි වැඩ පරීක්ෂක තනතුර ........................................ සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2014.05.07 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..................................

නම : ..................................

තනතුර : ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2014. 06 30

නිලමුද්‍රාව:

ඩී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

(10/24)

ඇමුණුම 01

1. විභාගයේ නම : ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමේ ලිඛිත විභාගය.

2. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | | කාලය | මුළු ලකුණු | සමත්වීමේ ලකුණු |
|---|---|---|---|---|
| I | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3 | 100 | 40% |
| II | බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : ආහාර කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද යන වග - අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ගොඩනැගිලි ඉදි කිරීම<br>සැළසුම් සකස් කිරීම<br>නඩත්තු(වායු සමීකරණ,ජලනල,විදුලිය)<br>පිඹුරුපත් කියවීම<br>වැඩ බිමක සේවක කළමනාකරණය පිළිබඳ මූලික සංකල්ප |
| බුද්ධි පරීක්ෂණය | සාමාන්‍ය දැනීම |

සකස් කලේ

අත්සන :....................................
නම : එම්.ඒ.ඒ.කුසුමාංගනී
තනතුර : පරිපාලන නිලධාරී (වැ.බ)
දිනය : 2014.05.21

පරීක්ෂා කලේ

අත්සන :....................................
නම : අශානි එන්.පියසුමන
තනතුර : සහකාර ආහාර කොමසාරිස්
දිනය : 2014.05.21

අත්සන :....................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : එන්.නිමල්කා ඩයස්
තනතුර : ආහාර කොමසාරිස්
දිනය : 2014.05.22
නිල මුද්‍රාව :

11/24

ඇමුණුම 02

1. විභාගයේ නම - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුර සඳහා වන පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර -

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීමේ ලකුණු |
|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීමේ ශිල්පය හා ඇස්තමේන්තුකරණය | පැය 2 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා - ආහාර කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග - අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීමේ ශිල්පය හා ඇස්තමේන්තුකරණය | දෙපාර්තමේන්තුවට අදාලව ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් පිළිබඳව සහ දෙන ලද සැළසුමකට අනුව ඇස්තමේන්තු සැකසීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න පත්‍රයකි. |

සකස් කලේ

අත්සන :...........................................
නම : එම්.ඒ.ඒ.කුසුමාංගනී
තනතුර : පරිපාලන නිලධාරී (වැ.බ)
දිනය : 2014.05. 21

පරීක්ෂා කලේ

අත්සන :...........................................
නම : අශානි එන්.පියසුමන
තනතුර : සහකාර ආහාර කොමසාරිස්
දිනය : 2014.05. 21

අත්සන :...........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : එන්.නිමල්කා ඩයස්
තනතුර : ආහාර කොමසාරිස්
දිනය : 2014.05. 22
නිල මුද්‍රාව : එන්. නිමල්කා ඩයස්
ආහාර කොමසාරිස්
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
330, ප්‍රතියන් පෙදෙස
කොළඹ 02.

ඇමුණුම 03

1. විභාගයේ නම - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුර සඳහා වන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර -

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීමේ ලකුණු |
|---|---|---|---|
| 1. වැඩ බිමක පිරිස් කළමණාකරණය | පැය 02 | 100 | 40% |

3. විභාගය පවත්වන බලධරයා - ආහාර කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

4.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග - අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. වැඩ බිමක පිරිස් කළමනාකරණය | වැඩ බිමක සේවක පරිපාලනය සම්බන්ධ කළමනාකරණ දැනුම දක්වන්නේද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |

සකස් කලේ

අත්සන :.........................................

නම : එම්.ඒ.ඒ.කුසුමාංගනී

තනතුර : පරිපාලන නිලධාරී (වැ.බ)

දිනය : 2014.05. 21

පරීක්ෂා කලේ

අත්සන :.........................................

නම : අශානි එන්.පියසුමන

තනතුර : සහකාර ආහාර කොමසාරිස්

දිනය : 2014.05. 21

අත්සන :.........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එන්.නිමල්කා ඩයස්

තනතුර : ආහාර කොමසාරිස්

දිනය : 2014.05. 22

නිල මුද්‍රාව : එන්. නිමල්කා ඩයස්
ආහාර කොමසාරිස්
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
... ලුයියන් පෙදෙස
කොළඹ 12.